ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2486/09 – 2026 අප්‍රේල් මස 28 වැනි අඟහරුවාදා – 2026.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනය**

**ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ විධිවිධාන ප්‍රකාර, ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව මගින් සම්මත කරනු ලැබ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද එකී තීරණයන් පහත උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පඩිපාලක සභා ආඥාපනතේ 29(3) වන වගන්තියෙහි විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2026 අප්‍රේල් මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

**එස්.එම්. පියතිස්ස,**
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

2026 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ 05,
"මෙහෙවර පියෙස" දී ය.

*උපලේඛනය*

ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1978 අගෝස්තු මස 11 වැනි දින අංක 330 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, සහ අවසන් වරට 2022 ජනවාරි මස 07 වැනි දින අංක 2261/75 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙන් වෙනස් කරන ලද්දා වූ තීරණවල II වැනි කොටසේ 5 ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් එම උපලේඛනය තවදුරටත් වෙනස් කළ යුතුය.

1A – G 46713 – 08 (2026/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) ක්‍රියාකාරී සේවාවන් : ආරක්ෂක නිලධාරීන්, ආරක්ෂක භටයින්, මුරකරුවන්, පැට්රෝල්මන් හෝ කිනම් නමින් හැඳින්වුවද ක්‍රියාකාරී සේවාවන්හි යෙදෙන සේවකයින්.

(ආ) පාලනමය සේවාවන් : ක්‍රියාකාරී සේවාවන්හි පාලනයෙහි නියුක්ත සේවකයන්, කාර්යභාර නිලධාරීන්, මුරසේවා භාර සුපරවයිසර්වරු හෝ සුපවයිසර්වරු.

ඉහතින් දක්වා ඇති සේවකයින්ට ගෙවිය යුතු කාල මිම්මේ මාසික අවම වේතන මෙසේය.

**අවම මාසික වේතනය**

| *සේවා වසර* | *ක්‍රියාකාරී සේවාවන්* | *පාලනමය සේවාවන්* |
|---|---|---|
| 1 වන වසර | 30,000.00 | 30,775.00 |
| 2 වන වසර | 30,100.00 | 30,925.00 |
| 3 වන වසර | 30,200.00 | 31,075.00 |
| 4 වන වසර | 30,300.00 | 31,225.00 |
| 5 වන වසර | 30,400.00 | 31,375.00 |
| 6 වන වසර | 30,500.00 | 31,525.00 |
| 7 වන වසර | 30,600.00 | 31,675.00 |
| 8 වන වසර | 30,700.00 | 31,825.00 |
| 9 වන වසර | 30,800.00 | 31,975.00 |
| 10 වන වසර | 30,900.00 | 32,125.00 |
| 11 වන වසර | 31,000.00 | 32,275.00 |
| 12 වන වසර | 31,100.00 | 32,425.00 |
| 13 වන වසර | 31,200.00 | 32,575.00 |
| 14 වන වසර | 31,300.00 | 32,725.00 |
| 15 වන වසර | 31,400.00 | 32,875.00 |
| 16 වන වසර | 31,500.00 | 33,025.00 |
| 17 වන වසර | 31,600.00 | 33,175.00 |
| 18 වන වසර | 31,700.00 | 33,325.00 |
| 19 වන වසර | 31,800.00 | 33,475.00 |
| 20 වන වසර | 31,900.00 | 33,625.00 |
| 21 වන වසර | 32,000.00 | 33,775.00 |
| 22 වන වසර | 32,100.00 | 33,925.00 |
| 23 වන වසර | 32,200.00 | 34,075.00 |
| 24 වන වසර | 32,300.00 | 34,225.00 |
| 25 වන වසර | 32,400.00 | 34,375.00 |
| 26 වන වසර | 32,500.00 | 34,525.00 |

EOG 04– 0212

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.